G.C.E. ORDINARY LEVEL EXAMINATION 2023 (2024)

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2023 (2024)

STUDENT SEMINAR SERIES

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

**Second Language – Sinhala**

**දෙවන බස - සිංහල**

**இரண்டாம் மொழி – சிங்களம்**

# QUESTION PAPER – 1

## ප්‍රශ්න පත්‍රය 01



අනුග්‍රහය

ICT BRANCH Ministry of Education Sri Lanka

NenasaTV

e තක්සලාව The National e-learning Portal for The General Education

# අධ්‍යාපන අමාත්‍යාංශය

දෙවන බස සිංහල – I කොටස

**අ.පො.ස (සා.පෙළ) 2023 (2024)** – ආදර්ශ ප්‍රශ්න පත්‍රය

**11 ශ්‍රේණිය** **කාලය පැය - 3:00**

**සැලකිය යුතුයි :**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

**கவனிக்க வேண்டியவை:**

- சகல வினாக்களுக்கும் விடையளிக்க.
- 1 தொடக்கம் 40 வரையான வினாக்களுக்கு வழங்கப்பட்டுள்ள விடைகளுள் சரியான அல்லது மிகப் பொருத்தமான விடையினைத் தெரிவு செய்க.
- உங்களுக்கு வழங்கப்படும் விடைத்தாளில் ஒவ்வொரு வினாவுக்கும் தரப்பட்டுள்ள அடைப்புக்குள் தெரிவுசெய்த விடைக்குப் பொருத்தமான அடைப்புக்குள் புள்ளி (X) இடவும்.

**Instructions**

- Answer **all** questions.
- In each of the questions from **1** to **40**, pick one of the alternatives (1), (2), (3), (4) which is **correct** or **most appropriate.**
- **Mark a cross (X) on the number corresponding to your choice in the answer sheet provided.**

- අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින්** මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් සුදුසු පද යුගලය තෝරන්න.
  **1** தொடக்கம் **5** வரையுள்ள வினாக்களில் **தடித்த எழுத்தில்** தரப்பட்டுள்ள சொற்களுக்குப் பதிலாக இடத்தக்க மிகவும் பொருத்தமான சொற்சோடியைத் தெரிவுசெய்க.
  Select the most suitable pair of word for the word printed in **bold letters** in questions from No.**1** to**5**.

1. අපි කොම්පෝස්ට් වළක් **හදන්නෝන.**
   (1) හදන්න ඕන (2) හදන ඕන (3) හදන්නේ ඕන (4) හදන් ඕන

2. මේ මල් ගසේ අතු **කපන්නෙපා.**
   (1) කපන එපා (2) කපන්නේ එපා (3) කපනවා එපා (4) කපන්න එපා

3. තීන්ත **හැලෙන්නැතිව** ගාන්න.
   (1) හැලෙන්න නැතිව (2) හැලෙන්නේ නැතිව (3) හලන්නේ නැතිව (4) හැලෙන නැතිව

4. නිවාඩුවට ගමේ **යන්නැද්ද?**.
   (1) යන්නේ නැද්ද? (2) යන්නට නැද්ද? (3) යනවා නැද්ද? (4) යන්න නැද්ද?

5. ඔයා උත්සවයට යන්නේ **කවුරුත්තෙක්ක ද?**
   (1) කවුරු තෙක්කද? (2) කවුරු තෙකක්ද? (3) කවුරුත් එක්කද? (4) කවුරුත් එකක්ද?

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්නවල දී ඇති පද අතුරින් **නිවැරදි උච්චාරණය** සහිත උත්තරය තෝරන්න.
  **6** தொடக்கம் **10** வரையான வினாக்களில் தரப்பட்டுள்ள சொற்களில் **சரியான உச்சரிப்பைத்** தரும் விடையைத் தெரிவு செய்க.
  Select the answer with **correct pronunciation** from the words given in questions from No.**6** to **10.**

6. (1) සෙනසුම (2) සැන්නසුම (3) සැනසුම (4) සනසුම

7. (1) බශ්නාහිර (2) බස්නහිර (3) බස්නාගිර (4) බස්නාහිර

8. (1) කෘමි සතුන් (2) කුරුමි සතුන් (3) කුර්මි සතුන් (4) කෲමි සතුන්

9. (1) සැනහස (2) සෙනෙහස (3) සෙනැහස (4) ස්නේහස

10. (1) කළු ලැල්ල (2) ගළු ලැල්ල (3) කළු ලේල්ල (4) කළු ලෙල්ල

- අංක 11 සිට 14 තෙක් ඇති එක් එක් ප්‍රකාශ සඳහා **වඩාත් ගැළපෙන** ප්‍රශ්නය තෝරන්න.
  **11** தொடக்கம் **14** வரையான ஒவ்வொரு கூற்றுக்கும் **மிகப்பொருத்தமான** வினாவைத் தெரிவு செய்க.
  Select the **most appropriate** question for each statement given from No. **11** to **14**.

11. පාඨමාලාව පෙබරවාරි දෙවැනි දා පටන් ගන්නවා.
    (1) පාඨමාලාව පටන් ගන්නේ කොහේ ද? (2) පාඨමාලාව පටන් ගන්නේ කාට ද?
    (3) පාඨමාලාව පටන් ගන්නේ කවදා ද? (4) පාඨමාලාව පටන් ගන්නේ ඇයි?

12. කවුන්ටරය සවස හතරට වහනවා.
    (1) කවුන්ටරය වහන්නේ කීයට ද? (2) කවුන්ටරය වහන්නේ කොතන ද?
    (3) කවුන්ටරය වහන්නේ කොහොම ද? (4) කවුන්ටරය වහන්නේ කුමකට ද?

13. විදුහල්පතිතුමා කරුණු පැහැදිලි කළා.
    (1) කරුණු පැහැදිලි කළේ කාට ද? (2) කරුණු පැහැදිලි කළේ කොහොම ද?
    (3) කරුණු පැහැදිලි කළේ කවුද? (4) කරුණු පැහැදිලි කළේ ඇයි?

14. චාරිකාවට ළමයි අසූ දෙනෙක් සහභාගි වෙනවා.
    (1) චාරිකාවට සහභාගි වන්නේ කොහොම ද? (2) චාරිකාවට සහභාගි වන්නේ කීදෙනෙක් ද?
    (3) චාරිකාවට සහභාගි වන්නේ කීයට ද? (4) චාරිකාවට සහභාගි වන්නේ කවදා ද

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **නිවැරදිව අකුරු** යෙදී ඇති පදය තෝරන්න.
  **15** தொடக்கம் **17** வரையான வினாக்களில் **சரியான எழுத்துக்கூட்டலைக்** கொண்ட சொல்லைத் தெரிவு செய்க.
  Select the answer with **correct spelling** in questions No. **15** to **17**.

15. (1) ශ්‍රී මහා බෝධිය (2) ශ්‍රී මහා බෝදිය (3) ශ්‍රී මහා පෝධිය (4) ශ්‍රී මහා හෝධිය
16. (1) කොට්ඨාෂය (2) කොට්ඨාශය (3) කොට්ඨාසය (4) කොට්ටාෂය
17. (1) තාක්ශණය (2) තාක්ෂණය (3) තාක්සනය (4) තාක්ෂනය

- අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල **නොගැළපෙන පදය** තෝරන්න.
  **18** தொடக்கம் **20** வரையான வினாக்களில் **பொருத்தமற்ற** சொல்லைத் தெரிவு செய்க.
  Select the **inappropriate** word in question from No. **18** to **20**.

18. (1) නාදය (2) ශබ්දය (3) ගීතය (4) හඬ
19. (1) කිරනවා (2) වැහෙනවා (3) මනිනවා (4) නවනවා
20. (1) කොළඹ (2) ඊසාන (3) නිරිත (4) වයඹ

- අංක **21** සිට **23** තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් දෙන පදය** තෝරන්න.
  **21** தொடக்கம் **23** வரையான வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **ஒத்தகருத்தைத் தரும் சொல்லைத்** தெரிவு செய்க.
  Select the **synonym** for the word given at the beginning in questions from No. **21** to **23**.

21. පවස : (1) ගින්න (2) පිපාසය (3) පිනවීම (4) සිසිල
22. නිවහන : (1) ඉඩම (2) ස්ථානය (3) නිදහස (4) ගෘහය
23. කුඹුර : (1) හේන (2) කමත (3) කෙත (4) නියර

- අංක 24 සිට 25 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් දෙන පදය** තෝරන්න.
  **24, 25** ஆகிய வினாக்களில் ஆரம்பத்தில் தரப்பட்ட சொல்லுக்கு **எதிர்க்கருத்தைத் தரும் சொல்லைத்** தெரிவு செய்க.
  Select the **antonym** for the word given at the beginning in questions No. **24** and **25**.

24. සත්‍යය : (1) ඇත්ත (2) ස්ථිර (3) සත්ව (4) අසත්‍යය
25. සරල : (1) සංවරණ (2) සරණ (3) සංකීර්ණ (4) සවන

- අංක **26** සිට **28** තෙක් එක් එක් ප්‍රශ්නයේ දී ඇති පින්තූරය සඳහා **වඩාත් ගැළපෙන අදහස** දැක්වෙන වරණය තෝරන්න.
  **26** தொடக்கம் **28** வரையான ஒவ்வொரு வினாவிலும் தரப்பட்டுள்ள படத்துக்கு **மிகப் பொருத்தமான கருத்தைத்** தரும் விடையைத் தெரிவுசெய்க.
  Select the option that gives the **most suitable idea** for the picture given in each question from No. **26** to **28.**

26. 

(1) කුරුල්ලන් ගැවසෙන ස්ථානයකි.
(2) තැපැල් දෙපාර්තමේන්තුව
(3) ගුවන්තොටුපල ඉදිරියෙනි.
(4) වනජීවී දෙපාර්තමේන්තුව

27. 

(1) ජල ක්‍රීඩා කරන ස්ථානයකි.
(2) අත් එසවීම තහනම්.
(3) දිය නෑම අනතුරුදායකයි.
(4) දිය නෑමට සුදුසු ස්ථානයකි.

28. 

(1) පාවහන් පැලඳීම අනිවාර්යයි.
(2) පාවහන් රැගෙන එන්න.
(3) පාවහන් පැලඳ ඇතුළු වන්න.
(4) පාවහන් ගලවා ඇතුළු වන්න.

- අංක **29** සහ **30** ප්‍රශ්නවලට **ගැළපෙන උත්තරය** තෝරන්න.
  29,30 ஆகிய வினாக்களுக்குப் **பொருத்தமான விடையைத்** தெரிவுசெய்க.
  Select the **suitable answer** for questions No. **29** and **30**.

29. අනුන්ගේ යහපත ගැන සිතන තැනැත්තා.
(1) පරාර්ථකාමියා (2) ආගන්තුකයා (3) ආරක්ෂකයා (4) ආත්මාර්ථකාමියා

30. තාත්තාගේ මල්ලී මගේ කවුද?
(1) ලොකුතාත්තා (2) මාමා (3) බාප්පා (4) මස්සිනා

- අංක **31** සහ **32** යන එක් එක් ප්‍රශ්නවල වාක්‍ය දෙක බැගින් දී ඇත. එම වාක්‍ය දෙක එක් වාක්‍යයක් ලෙස **නිවැරදි ව** සම්බන්ධ කර **ලියා ඇති වාක්‍යය** තෝරන්න.
  31,32 ஆகிய வினாக்களில் இரு வாக்கியங்கள் தரப்பட்டுள்ளன. அந்த இரு வாக்கியங்களையும் சரியாக இணைத்து ஒரு வாக்கியமாக்கி **எழுதப்பட்டுள்ள வாக்கியத்தைத்** தெரிவுசெய்க.
  In questions No. **31** and **32**, two sentences each are given. Select the **sentence** that **correctly** combines the two sentences.

31. වෛද්‍යවරයා රෝහලට ගියේ ය. රෝගියාට ප්‍රතිකාර කළේ ය.
(1) වෛද්‍යවරයා රෝහලට යමින් රෝගියාට ප්‍රතිකාර කළේ ය.
(2) වෛද්‍යවරයා රෝහලට ගොස් රෝගියාට ප්‍රතිකාර කළේ ය.
(3) වෛද්‍යවරයා රෝහලට යනවිට රෝගියාට ප්‍රතිකාර කළේ ය.
(4) වෛද්‍යවරයා රෝගියාට ප්‍රතිකාර කර රෝහලට ගියේ ය.

32. ගිලන් රථය නළාව හඬවයි. එය වේගයෙන් ධාවනය වෙයි.
(1) ගිලන් රථය නළාව හඬවද්දී වේගයෙන් ධාවනය වෙයි.
(2) ගිලන් රථය නළාව හැඬ වූ නිසා වේගයෙන් ධාවනය වෙයි.
(3) ගිලන් රථය නළාව හැඬවීමෙන් පසු වේගයෙන් ධාවනය වෙයි.
(4) ගිලන් රථය නළාව හඬවමින් වේගයෙන් ධාවනය වෙයි.

- අංක **33** සහ **34** ප්‍රශ්නවල හිස්තැනට **වඩාත් සුදුසු උත්තරය** තෝරන්න.
  33, 34 ஆகிய வினாக்களிலுள்ள இடைவெளிக்கு **மிகவும் பொருத்தமான சொல்லைத்** தெரிவுசெய்க.
  Select the **most suitable answer** to fill in each blank in questions No. **33** and **34.**

33. උනන්දුවෙන් වැඩ ........................................ ජය නියතයි.
(1) කරයි (2) කළොත් (3) නො කළොත් (4) කළා

34. වසර අවසානයේ .................................... පැවැත්වෙයි.
(1) විභාගයක් (2) විභාගයක (3) විභාගයකින් (4) විභාගයකට

- අංක **35** ප්‍රශ්නයේ **තද කළු** පැහැයෙන් මුද්‍රිත සංඛ්‍යාව නිවැරදිව අකුරෙන් ලියා ඇති පිළිතුර තෝරන්න.
  **35** ஆம் வினாவில் **தடித்த எழுத்திலுள்ள** எண், சரியான எழுத்துகளால் எழுதப்பட்டுள்ள விடையைத் தெரிவுசெய்க.
  Select the answer in which the number in **bold** print has been correctly written in letters question No. **35**.

35 රැස්වීමට මිනිස්සු **4768** දෙනෙක් සහභාගි වූහ.
(1) හාරසිය හැත්තෑ හැට අට (2) හාරදහස් හැත්තෑ හයයි අට
(3) හතළිස් හතයි හැට අට (4) හාරදහස් හත්සිය හැට අට

- අංක **36** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයේ **ව්‍යාකරණානුකූල ව** නිවැරදි වාක්‍යය තෝරන්න.
  **36** தொடக்கம் 40 வரையான ஒவ்வொரு வினாவிலும் **இலக்கணரீதியாக சரியான** வாக்கியத்தைத் தெரிவு செய்க.
  Select the **grammatically correct** sentence in each question from No. **36** to **40**.

36. (1) තාත්තා සහ මම බැංකුවට ගියෙමි.
(2) තාත්තා සහ මම බැංකුවට ගියෙමු.
(3) තාත්තා සහ මම බැංකුවට ගියේ ය.
(4) තාත්තා සහ මම බැංකුවට ගියෝ ය.

37. (1) ගායිකාව මිහිරි ගීතයක් ගායනා කළා ය.
(2) ගායිකාව මිහිරි ගීතයක් ගායනා කළේ ය.
(3) ගායිකාවෝ මිහිරි ගීතයක් ගායනා කළා ය.
(4) ගායකයා මිහිරි ගීතයක් ගායනා කළා ය.

38. (1) දිනපතා කොළඹ වරායට නැව් රාශියක් පැමිණෙයි.
(2) දිනපතා කොළඹ වරායට නැව් රාශියක් පැමිණෙති.
(3) දිනපතා කොළඹ වරායට නැව් රාශියක් පැමිණියා ය.
(4) දිනපතා කොළඹ වරායට නැව් රාශියක් පැමිණියෝ ය.

39. (1) දෙමවුපියෝ ශිෂ්‍යයින් සමග චාරිකාවට සහභාගි වුණේය.
(2) දෙමවුපියෝ ශිෂ්‍යයින් සමග චාරිකාවට සහභාගි වන්නේ ය.
(3) දෙමවුපියෝ ශිෂ්‍යයින් සමග චාරිකාවට සහභාගි වුණා ය.
(4) දෙමවුපියෝ ශිෂ්‍යයින් සමග චාරිකාවට සහභාගි වූණෝ ය.

40. (1) විනිසුරුවරිය තරගය ආරම්භ කළා ය.
(2) විනිසුරුවරිය තරගය ආරම්භ කළෝ ය.
(3) විනිසුරුවරිය තරගය ආරම්භ කළේ ය.
(4) විනිසුරුවරිය තරගය ආරම්භ කළහ.

G.C.E. ORDINARY LEVEL EXAMINATION 2023 (2024)

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2023 (2024)

STUDENT SEMINAR SERIES

ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

**Second Language – Sinhala**

**දෙවන බස - සිංහල**

**இரண்டாம் மொழி – சிங்களம்**

# QUESTION PAPER – II

# ප්‍රශ්න පත්‍රය - II



අනුග්‍රහය

# අධ්‍යාපන අමාත්‍යංශය கல்வி அமைச்சு

දෙවන බස සිංහල - I, II இரண்டாம் மொழி தமிழ் - I, II

**අ.පො.ස (සා.පෙළ) 2023 (2024)** - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

I කොටසේ අංක 1 හා 2 ප්‍රශ්න ඇතුළු ව II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් උත්තර ලියන්න.

பகுதி **i இல் 1 ஆம் 2 ஆம்** வினாக்கள் உட்பட பகுதி **ii** இல் **ஒரு** வினாவையும் பகுதி **iii** இல் **இரு** வினாக்களையும் தெரிவுசெய்து எல்லாமாக **ஐந்து** வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.

Answer only **five** questions including questions **1** and **2** in part I and selecting **one** question from part II and **two** questions from part III

## දෙවන බස සිංහල - II

### I කොටස / பகுதி I / Part I

1. දී ඇති මාර්ගෝපදේශය ඇසුරු කරගෙන පහත දැක්වෙන මාතෘකාවලින් **එකක්** ගැන වචන **100**ක පමණ රචනයක් ලියන්න.
   பின்வரும் தலைப்புகளுள் **ஒன்றைத்** தெரிவுசெய்து அதன் கீழே தரப்பட்டுள்ள விடயங்களை அடிப்படையாகக் கொண்டு ஏறத்தாழ **100 சொற்களில்** அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.
   Write an essay of about **100 words** on one of the following topics using the given guidelines.

(අ) ගස් වැල් අපේ මිතුරෝ ය.
- (I) හැඳින්වීම.
- (II) ගස්වැල් රැකගැනීමේ වැදගත්කම.
- (III) ගස්වැල් විනාශ වන ආකාරය පැහැදිලි කිරීම.
- (IV) ගස්වැල් රැකගත යුත්තේ කෙසේ ද?
- (V) සමාලෝචනය.

(ආ) මගේ අනාගත බලාපොරොත්තුව.
- (I) හැඳින්වීම.
- (II) අනාගත බලාපොරොත්තුවේ ස්වභාවය.
- (III) එමගින් සමාජයට ඇතිවෙන මෙහෙය.
- (IV) ඒ තුළින් තමන් ලබන සතුට.
- (V) සමාලෝචනය.

(ඉ) මත් උවදුර තුරන් කරමු.
- (I) හැඳින්වීම.
- (II) මත්ද්‍රව්‍යවලට ගොදුරුවන්නේ කෙසේ ද?
- (III) මත්ද්‍රව්‍යවලට ගොදුරු වීමෙන් ඇති වන හානි
- (IV) මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග.
- (V) සමාලෝචනය.

(ඊ) මා දුටු දිය ඇල්ලක්.
- (I) හැඳින්වීම.
- (II) දියඇලිවල සුන්දරත්වය.
- (III) දියඇල්ලකින් ලැබෙන ප්‍රයෝජන.
- (IV) දිය ඇල්ල ආරක්ෂා කරගන්නා ආකාරය.
- (V) සමාලෝචනය.

(උ) කුණු කසළ නිසි ලෙස බැහැර කරමු.
- (I) හැඳින්වීම
- (II) නිසි ලෙස කසළ බැහැර නො කිරීම නිසා පරිසරයට සිදුවන හානි
- (III) කසළ කළමනාකරනයේ වැදගත්කම
- (IV) කසළ නොමැති පරිසරයක සුන්දරත්වය
- (V) සමාලෝචනය

2. දී ඇති පින්තූරය බලා ඒ ඇසුරෙන් අර්ථවත් වාක්‍ය පහක් ගොඩනගන්න.
(වාක්‍යයක අවම වශයෙන් වචන හතරක් වත් තිබිය යුතුය).
தரப்பட்டுள்ள படத்தை அடிப்படையாகக் கொண்டு கருத்துள்ள **ஐந்து** வாக்கியங்கள் எழுதுக.
(ஒரு வாக்கியத்தில் குறைந்த பட்சம் **நான்கு** சொற்களாவது இருத்தல் வேண்டும்).
Compose five meaningful sentences with references to the given picture. ( There should be at least four words in a sentence).



**II කොටස - பகுதி II - Part - II**

- අංක **3 හා 4** යන ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර සපයන්න.
  3 ஆம் 4 ஆம் வினாக்களுள் ஏதேனும் **ஒரு** வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.
  Answer only **one** question from question No. **3** and **4.**

**3.** පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் கவிதையை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடைஎழுதுக.
Read the following poem and answer the questions given.

පාට සුවඳ එක වගේ
තිබෙන රෝස මල වගේ
කීකරු පොඩි ළමයගේ
කවුරුත් පවසති අගේ

මවුපියන්ට ගුරුවරුන්ට
ගුණවත් වැඩිමහල්ලන්ට
කීකරු වන පොඩිත්තන්ට
පුළුවනි ලොව බබළවන්ට

පොතටපතට සිතදීමයි
හැකි තරමින් ඉගෙනීමයි
කාගෙත් සිත් පිනවීමයි
මේ ටික අපෙ පැවතීමයි

ගෙඩි මල් කොළ තිබෙන ගහා
සැලෙන ලෙසින් එහා මෙහා
හොඳ ළමයා නොව තරහා
අවවාදෙට නැමෙයි වහා

මල්වල සුමිහිරි පැණී
ඇද බොන බඹරා මෙනී
හොඳ ළමයා නුවණිනී
හොඳ දේ තෝරා ගනී

(I) රෝස මලක එක වගේ තිබෙන්නේ මොනවා ද?

(II) කීකරු දරුවන්ට කළ හැක්කේ කුමක් ද?

(III) කවියෙන් කියවෙන පරිදි කාගෙත් සිත් පිනවිය හැක්කේ කෙසේ ද?

(IV) ළමයෙකුගේ නො තිබිය යුතු ගුණාංගයක් දක්වන්න.

(V) ළමයා නුවණින් හොඳ දේ තෝරා ගන්නේ කෙසේ ද?

4 පහත සඳහන් ඡේද කියවා, අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.
பின்வரும் உரைப்பகுதியை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.
Read the following paragraphs and answer the given questions.

මී පැණි ඉතා රසවත්, මිහිරි ආහාරයකි. එසේ ම වටිනා ඖෂධයකි. මී පැණි නිපදවනු ලබන්නේ මී මැස්සන් විසිනි. මී පැණි පිරුණු මී වදවලට සියලු දෙනා ප්‍රිය කරති.

සෑම මී මැසි ජනපදයක් ම රාජධානියකි. එහි රැජින මී මැසි රැජින යි. කම්කරු මැස්සියෝ සහ මැස්සෝ ද පිලවු ද එහි වෙසෙති.
බිත්තර දමන්නේ රැජින ය. වද බැඳීම, රොන් රැස් කිරීම, පැණි නිෂ්පාදනය ආදි සියලු කාර්යයන් මැස්සියන් විසින් ඉටු කරනු ලැබේ. ආරක්ෂාව සඳහා වෙනම කණ්ඩායමක් රාජකාරියේ නිරත වෙති.

මීමැස්සා ඉතා කඩිසර ය. එසේ ම ක්‍රියාශීලී ය. රංචු වශයෙන් රොන් සොයා මලින් මලට පියාඹා යති. මී මැස්සියන් සියල්ලෝ ම එක සමානව වෙහෙස වී වැඩ කරති.

මී මැස්සන් සත්ව ලෝකයේ ඉතා සාමූහික ව හා එකමුතු ව සහයෝගයෙන් වගකීම් ඉටු කරන සත්ව විශේෂයකි . මී මැස්සාගේ මෙම ක්‍රියාවලිය අපට ද මහඟු ආදර්ශයකි.

(I) මී මැසි රාජධානියේ ප්‍රධානියා කවුරුන් ද?
(II) මී මැස්සන් විසින් මී පැණි ගබඩා කරන්නේ කොහේ ද?
(III) මැස්සියන් විසින් ඉටු කරනු ලබන කාර්යයන් දෙකක් ලියන්න.
(IV) මිනිසාට මී මැස්සන්ගෙන් ලබා ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.
(V) " කම්මැළි " යන පදයට විරුද්ධ පදයත්,
"ඔසු " යන පදයට සමාන පදයත් ඉහත ඡේදයෙන් සොයා ලියන්න.

## III කොටස - பகுதி III - Part III

- අංක **5** හා 6 යන ප්‍රශ්න **දෙකට ම** උත්තර ලියන්න.
  **5,6** ஆகிய **இரண்டு** வினாக்களுக்கும் விடை எழுதுக.
  Answer both questions No. **5** and **6.**

5. පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන අයදුම් පතක් සකස් කරන්න.
பின்வரும் விடயங்களை கருத்திற்கொண்டு விண்ணப்பப்படிவம் ஒன்று தயாரிக்குக.
Prepare an application based on the following details.
"පරිගණක ක්‍රියාකරු" තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම් පත් කැඳවා ඇත.

- ශ්‍රී ලංකා පුරවැසියෙකු වීම
- වයස අවුරුදු 20ත් 45ත් අතර වීම
- අධ්‍යාපන පොදු සහතික පත්‍ර උසස් පෙළ සමත්ව තිබීම
- පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම
- සේවා පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ

ඔබ ඉහත සුදුසුකම් සපුරා ඇති බව සලකා අදාළ තොරතුරු ඇතුළත් කරමින් අයදුම් පතක් සකස් කරන්න.

**නැතහොත්**
**அல்லது**
**Or**

පහත දැක්වෙන තොරතුරු පදනම් කර ගෙන රාජකාරි ලිපියක් ලියන්න.
பின்வரும் விடயங்களை கருத்தில் கொண்டு உத்தியோகபூர்வ கடிதம் ஒன்று எழுதுக.
Based on the following facts write an official letter.

ඔබේ ගමේ වීදි ලාම්පු නිසි පරිදි නඩත්තු කිරීම සිදු නොවේ. එම නිසා රාත්‍රී කාලයේ මාර්ගයේ ගමන් කිරීමේ දී නොයෙකුත් අපහසුතාවලට මුහුණපෑමට සිදු වේ. එම නිසා මෙම අවශ්‍යතාව කෙරෙහි විශේෂ අවධානය යොමු කර, වීදි ලාම්පු අලුත්වැඩියා කර දෙන මෙන් ඉල්ලා ප්‍රාදේශීය සභාවේ සභාපති වෙත ලිපියක් ලියන්න. ඔබ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් යැයි සිතන්න.

6. පහත දැක්වෙන දෙමළ වාක්‍ය හෝ ඉංග්‍රීසි වාක්‍ය **සිංහලට** පරිවර්තනය කරන්න.
கீழே தரப்பட்டுள்ள தமிழ் அல்லது ஆங்கில வாக்கியங்களை **சிங்களத்தில்** மொழிபெயர்க்குக.
Translate the following Tamil / English sentences into **Sinhala.**

(I) நான் அழகான சித்திரம் ஒன்று வரைந்தேன்.
I drew a beautiful picture.

(II) உணவுப் பொதிகளை சிற்றுண்டிச்சாலையில் பெற்றுக்கொள்ள முடியும்.
Food packs can be collected from the canteen.

(III) தயவுசெய்து பாதுகாப்பான இடங்களுக்குச் செல்லுங்கள்.
Please move to safe places.

(IV) ஓய்வு நேரத்தை மகிழ்ச்சியாகக் கழிப்போம்.
Let us spend our leisure time joyfully.

(V) வீதி ஒழுங்குகளை சரியாகப் பின்பற்றுவோம்.
Let us follow road safety rules properly.

**නැතහොත් / அல்லது / Or**

පහත සඳහන් තොරතුරු පදනම් කරගෙන සංවාදයක් ලියන්න. වාක්‍ය **10ක්** ප්‍රමාණවත් වේ.
பின்வரும் தகவல்களை அடிப்படையாகக் கொண்டு உரையாடல் ஒன்று எழுதுக.
(**10** வாக்கியங்கள் போதுமானது.)
Write a dialogue based on the following information. (**10** sentenses are enough.)

ඔබේ මිතුරා වන අමිල දින කිහිපයක් ම පාසලට පැමිණියේ නැත. ඔහු අසනීපයෙන් පසු වන බව ආරංචි විය. අමිලගේ සුවදුක් විමසා ඔහු සමග සිදුකරන දුරකථන සංවාදය ලියන්න.

- සුබ පතමින් සංවාදය ආරම්භ කිරීම.
- සැප සනීප හා පාසලට නොපැමිණීම පිළිබඳව විමසීම.
- පාසලේ තොරතුරු පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීම.
- අවශ්‍ය උදවු කිරීමට මැදිහත් වීම.
- සමුගැනීම.